# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021**
**2024 නොවැම්බර් / දෙසැම්බර්**

**සමාජීය විද්‍යා පීඨය**

## දේශපාලන විද්‍යාව

**(අධ්‍යයන වර්ෂය 2007 සිට 2016 දක්වා)**

## ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය හා දේශපාලනය POLS – E1025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "කෝල්බෲක් ප්‍රතිසංස්කරණ පසුකාලීන ශ්‍රී ලංකාවේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ වර්ධනයට මුල පිරුවේය." මේ ප්‍රකාශය පිළිබඳව අදහස් දක්වන්න.

02. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ 20 වන ශතවර්ෂයේ මුල් දශකයන්හි පැවැති ජාතික ව්‍යාපාරයේ කාර්යභාරය විවේචනය කරන්න.

03. ඩොනමෝර් ව්‍යවස්ථාව විසින් හඳුන්වා දුන් ආණ්ඩුකාරවරයාගේ බලතල හා කාර්යභාරය පැහැදිලි කරන්න.

04. සොල්බරි ව්‍යවස්ථාව යටතේ වූ ද්විත්ව විධායකය පැහැදිලි කරන්න.

05. ශ්‍රී ලංකාවේ 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව විසින් හඳුන්වා දුන් ජාතික රාජ්‍ය සභාවේ ව්‍යවස්ථාදායක පරමාධිපත්‍යය පිළිබඳව සාකච්ඡා කරන්න.

06. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දෙනු ලැබූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයේ කාර්යභාරය පරීක්ෂා කරන්න.

07. ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් ජනාධිපතිවරයා වෙත පිරිනමා ඇති බලතල සම්බන්ධයෙන් පවතින විවේචන මොනවාද? සාකච්ඡා කරන්න.

08. ජනරජයේ පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දී ඇති විධිවිධාන මොනවාද?

09. නිදහසින් පසු මුල් කාල පරිච්ඡේදයේදී ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය පිළිබඳව සාකච්ඡා කරන්න.

*************************